දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832

ලේකම් / செயலாளர் / Secretary } 2784811

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ......................................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/26/07/01/01

දිනය / திகதி / Date } 2011-06-21

**චක්‍රලේඛ අංක - 2011/19**

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

## පාසල් මට්ටමේ "පරිගණක දෘඪාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම" පිහිටුවීම

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජාතික මට්ටමේ පරිගණක දෘඪාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම, එක් කලාපයක් සඳහා ගුරුවරුන් දෙදෙනකු බැගින් වන සේ ආරම්භ කරන ලද අතර එය මේ වන විට ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරන බව වාර්තා වී ඇත.

එම කාර්යය වඩාත් පහසුකරලීම පිණිසත්, පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය එදිනෙදා නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාම උදෙසාත්, එමෙන් ම සිසුන් කණ්ඩායමකට ඊට අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දීම උදෙසාත් '**පාසල් මට්ටමේ දෘඪාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම**' පහත සඳහන් උපදෙස් පරිදි ස්ථාපිත කිරීම අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

**කණ්ඩායමෙහි සංයුතිය**

මේ සඳහා පරිගණක දෘඪාංග හා ජාලකරණ කාර්යයෙහි දැනුම කුසලතා ලබා ගැනීමට කැමති සිසුන් යොදා ගත යුතු අතර, මෙම කණ්ඩායමට වසරකට අවම වශයෙන් එක් මධ්‍යස්ථානයක් සඳහා සිසුන් 6 දෙනකු වන සේ (8 ශ්‍රේණියේ සිසුන් දෙදෙනකු, 9 ශ්‍රේණියේ සිසුන් දෙදෙනකු සහ 10 ශ්‍රේණියේ සිසුන් දෙදෙනකු වශයෙන්) සිසුන් තෝරා ගත යුතු ය.

**පුහුණුව**

මෙම ළමුන් සඳහා මූලික පුහුණුව පාසලේ විෂය භාර ගුරුභවතා මඟින් ලබා දිය යුතු ය. ඉන්පසුව කලාප හා පළාත් විෂය භාර සම්බන්ධීකරණ නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් අදාළ පාසල් සියල්ල ආවරණය වන සේ සිසුන් හට කලාප/පළාත් දෘඪාංග හා ජාලකරණ කණ්ඩායමේ සාමාජිකයින් යොදවා වැඩිදුර පුහුණුවක් ලබා දිය යුතු අතර වරින් වර මෙම සිසුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

**<u>සිසුන් ඇගයීම</u>**

මෙම කාර්යයෙහි සාර්ථකව යෙදී සිටින සිසුන් සඳහා එම ක්ෂේත්‍රයට අදාළ වැඩිදුර අධ්‍යාපන පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය මහපෙන්වීම සිදු කළ යුතු අතර එවන් සිසුන් සඳහා එම කාර්යය අවසානයේ දී විශේෂ කාර්යය සාධන ඇගයීම් සහතිකයක් පාසල මඟින් විදුහල්පතිවරයාගේ අත්සනින් යුතු ව නිකුත් කළ යුතු වේ.

පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ප්‍රශස්ථ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහාත්, දෘඩාංග හා ජාලකරණ සම්බන්ධයෙන් පවතින රැකියා වෙළඳපොළට සුදුසු සිසුන් කණ්ඩායමක් බිහිකරලීම සඳහාත් මූලික වශයෙන් වැදගත් වන මෙම පියවර සඳහා ඔබගේ සක්‍රිය දායකත්වය විශේෂයෙන් අපේක්ෂා කරමි.

එච්. එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
2. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
3. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්